# ඕමානයේ සාත්තු සේවිකා රැකියා සඳහා කැමැත්තක් දක්වන සුදුසුකම් ලත් ශ්‍රී ලාංකිකයන් හඳුනා ගැනීම

ඕමානයේ සාත්තු සේවිකා රැකියා සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකිකයින්ට එරට රැකියා අවස්ථා උදාකර ගැනීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE) සහ ඕමානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය (SLEMB) එක්ව වැඩසටහනක් ආරම්භ කර ඇත.

ඒ අනුව අදාල සාකච්ඡා ආරම්භ කිරීම සඳහා, සුදුසුකම් ලත් පුද්ගලයින්ගේ දත්ත ලේඛනයක් නිර්මාණය කිරීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට හැකි වන පරිදි 2022.12.30 දිනට පෙර මෙම වෙබ් ද්වාරය ඔස්සේ තම දත්ත සහ ජීව දත්ත පත්‍රිකා (CV) ඉදිරිපත් කරන ලෙස ඕමානයේ ඉහත සඳහන් රැකියා ක්ෂේත්‍රයේ රැකියා සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ශ්‍රී ලාංකිකයින්ට (කාන්තා) මෙයින් ඇරයුම් කෙරේ.